Answer

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 11 ශ්‍රේණිය
## නර්තනය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 3 | (11) | 1 | (21) | 3 | (31) | 1 |
| (2) | 1 | (12) | 2 | (22) | 2 | (32) | 1 |
| (3) | 4 | (13) | 4 | (23) | 4 | (33) | 2 |
| (4) | 2 | (14) | 3 | (24) | 4 | (34) | 4 |
| (5) | 3 | (15) | 1 | (25) | 4 | (35) | 3 |
| (6) | 1 | (16) | 3 | (26) | 2 | (36) | 2 |
| (7) | 2 | (17) | 1 | (27) | 4 | (37) | 4 |
| (8) | 3 | (18) | 2 | (28) | 2 | (38) | 2 |
| (9) | 4 | (19) | 3 | (29) | 1 | (39) | 3 |
| (10) | 4 | (20) | 1 | (30) | 4 | (40) | 4 |

(ලකුණු 1 x 40 = 40)

### II පත්‍රය

(1) (i) ඉබන් බතූතා
(ii) ආචාර්ය මිරැන්ඩා හේමලතා මහත්මිය
(iii) විදුර
(iv) ශාන්තිදේවි ඝෝෂ්
(v) අද්භූත රසය
(vi) තානායම් පොළ
(vii) ඉගිනළු
(viii) විල්මට් ඒ පෙරේරා
(ix) දහඅට වන්නම සී ද එස් කුලතිලක ස්වර ලිපි සහිත දහඅට වන්නම - සරත් විජේවර්ධන
ලිය ගී/පැරණි වන්නම් /උඩරට නැටුම් කලාව / නෘත්‍යය රත්නාකරය
(x) පොන්නානි / ශිංකිටී (ලකුණු 12)

(2)

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| වත් | - | ත | ක | තත් | - | ක | තත් | - | තා | - | - |
| කු | ඹු | ර | ක | ත්‍රත් | - | ක | ත්‍රත් | - | තා | - | - |
| වත් | - | ත | ක | තත් | - | කු | ඹුර | - | ක | තත් | - |
| දෙ | ක | ම | ක | ත්‍රත් | - | ක | ත්‍රත් | - | තා | - | - |

රබන් පදය ප්‍රස්තාර කිරීම - 02
විභාග කර දැක්වීම සංකේත භාවිතය - 02

II

| ^ | | | / | | | | ^ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| ව | න | - | පැත් | - | ත | - | බි | ය | - | පත් | - | ව | - |
| ස | ය | - | නුම් | - | - | - | - | - | - | - | - | - | - |

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| දු | ටත් | - | ය | නෙ | න | වි | ටත් | - | දු | ව | න |
| වි | ට්‍රත් | - | පො | ට | ග | සා | - | ප | නි | මි | න// |

| ^ | | | / | | | | ^ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| නැ | ත | - | නා | - | ඕ | - | ඉ | ද | - | වා | - | ඕ | - |
| වෙවි | - | - | ලුම් | - | - | - | - | - | - | - | - | - | - |

පහතරට ශුද්ධ තාලය සින්දු වන්නම

| $\hat{1}$ | 2 | $\hat{1}$ | 2 | $\hat{1}$ | 2 | 3 | $\hat{1}$ | 2 | $\hat{1}$ | 2 | $\hat{1}$ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සි | රි | පි | රි | ගි | රි | - | - | - | - | - | - | - | - |
| මු | දු | න | ත | සු | ර | - | - | - | - | - | - | - | - |
| පු | ර | ලෙ | සි | නා | - | - | - | - | - | - | - | - | - |
| ආ | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| සි | රි | ල | ක | ප | ව | ර | - | - | - | - | - | - | - |
| දෙ | වි | පු | ව | රෙ | හි | - | - | - | - | - | - | - | - |
| වෙ | සෙ | ස | ව | නා | - | - | - | - | - | - | - | - | - |
| ආ | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |

**Answer**

**සබරගමු කොවුලා වන්නම**

| 1/ | 2 | 3 | 1/ | 2 | 3 | 1/ | 2 | 3 | 1/ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කො | හෝ | - | ය | නා | - | හ | ඬ | නා | ග | නා | - |
| මි | යු | රු | වු | නා | - | ද | න | ස | වු | නා | - |

| 1^ | 2 | 3 | 1/ | 2 | 3 | 4 | 1^ | 2 | 3 | 1/ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | + | + | ප | ර | පු | ටු | වෙ | සෙ | - | සෙන් | - | - | - |
| නේ | - | - | - | - | - | ව | සන් | - | - | නේ | - | - | - |
| + | + | + | ම | හ | ව | න | ගස් | - | - | මු | දු | - | - |
| නේ | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |

විභාග කර දැක්වීම සංකේත භාවිතය - 02

කවිය ප්‍රස්තාර කිරීම - 02

**ගුදගතිගත වට්ටම**

| 1/ | 2 | 1/ | 2 | 1/ | 2 | 1/ | 2 |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ගුං | - |
| දත් | - | ගුඹි | තිග | දිරි | කිට | ග | ත |
| ග | ත | ගති | තිග | තම් | - | තත් | - |
| දිත් | - | තත් | - | දිග | තම් | දොං | |

**කුදාංත ගත දොං වට්ටම**

| 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | + | + | + | තාම් | - | - | දො | මි | ති | ග | ත | දො | මි | කි | ට |
| කඩ | තක | තරි | කිට | කි | ත | ක | දො | මි | කි | ග | ත | කිත් | - | තත් | - |
| කු | ද | කු | ද | තා | - | කු | ජිත් | - | ත | ග | ත | දො | මි | කි | ට |
| තරි | කිට | කුං | දත් | තා | | | | | | | | | | | |

| 1/ | 2 | 3 | 1^ | 2 | 1^ | 2 | 1/ | 2 | 3 | 1^ | 2 | 1^ | 2 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ත | හර් | - | රු | ද | දොං | - | ග | ති | ත | ග | ත | දොං | - // |
| ත | හර් | - | රු | ද | දොං | - | ත | හර් | - | රු | ද | දොං | - |
| ත | හර් | - | රු | ද | දොං | - | ග | ති | ත | ග | ත | දොං | - |
| ග | ති | ත | ග | ත | දොං | - | ග | ති | ත | ග | ත | දොං | - |
| ත | හර් | - | රු | ද | දොං | - | ග | ති | ත | ග | ත | දොං | - |

විභාග කර දැක්වීම සංකේත භාවිතය - 02

කවිය ප්‍රස්තාර කිරීම - 02

මුළු ලකුණු - 12

(3) i සශ්‍රීකත්වය — සෞභාග්‍යය

ප්‍රජාර්ථය — විනෝදාස්වාදය (ලකුණු 2)

ii කෝලම් නාටක රඟ දක්වන ලද්දේ කවාකාර එළිමහන් රංග භූමියක වන අතර එය තානායම්පොළ නමින් හඳුන්වන ලදී. රඟ මඬල පේක්ෂකාගාරයෙන් වෙන් කිරීමට කෝටු සිටුවා ලනු ඇද ගොක් රැහැන් යොදා ඇත. තානායම්පොළට පිටුපසින් මඩුවක් ඉදිකරන ලද අතර එය කෝලම් ශිල්පීන්ගේ වෙස් මුහුණු ඇඳුම් පැළඳුම් තබා ගැනීම සඳහාත් නේවාසිකාගාරයක් ලෙසත් භාවිතා විය. මඩුවටත් තානායම්පොළටත් අතර කණු සිටුවා ලී පටි බැඳ පුවක්, ගොරකා වැනි අතු බැඳ සකස් කර ගන්නා ආවරණය වෙස් අත්ත නමින් හැඳින්විය. කෝලම් චරිත සබයට පිවිසෙන්නේ මෙම වෙස් අත්තට මුවා වී සිට ය. තානායම්පොළේ එක් පසෙකින් පහන් පැළක් ද ඉදි කරයි.

iii කෝලම් නාටකයේ චරිත නිරූපණය සඳහා නර්තනය, ගායනය වාදනය නිරූපණය යන රංග සියල්ල ම භාවිත කෙරේ. කෝලම් චරිත සබයට පිවිසීමට පෙර කෙටි කවි ගායනය කෙරේ. උදාහරණයක් ලෙස ජය කොළමේදී ජසයා සබයට පිවිසීමට පෙර

පෙර සිට පැවත එන - සිරිතට පොදිය බැඳගෙන

උර පිට දරා ගෙන - මෝඩ ජසයා ඒය දුවගෙන

කවි ගායනයෙන් පසු එක් අතෙකින් ලේන්සුවක් ගෙන පිළි පොට්ටනිය උරෙහි දරාගත් ජසයා නොන්ඩි කකුල අද්දමින් සබයට පිවිසෙන්නේ

''දොං දැතිං ගුද ගුද දැතිං''

යන බෙර පදයට අනුව සබයට පිවිසේ. අනතුරු ව ''දැහිං ගුද ගුද බෙර පදයට අනුව වේගවත් ගමනක යෙදෙන ජසයා ඉරට්ටිය නටයි. ඉන් පසු සිදු කරන ගායනයට සරල නර්තනයක යෙදෙමින් ප්‍රකාශාත්මක චලන ඉදිරිපත් කරයි. මෙහි ජසයා මෙම කවි තුළින් තමා පිළිබඳව හඳුන්වා දීමත් මෙන් ම ආත්ම වර්ණනාවක යෙදෙයි.

''මේ ගම් පියසේ හේනේ මාමල

කොච්චර සිටියත් මං වගේ වෙන නැත

රජ වාසලයෙන් සළු පිළි අරගෙන

වඩිනෙමි රජු වඩිනා පෙරමුණයට'' (ලකුණු 6)

**Answer**

(4) i සශ්‍රීකත්වය.

වසංගත රෝගවලින් අත්මිදීම.

ස්වාභාවික විපත් හා ආපදාවලින් ආරක්ෂා වීම.

සෞභාග්‍යය.

විනෝදාස්වාදය. (ලකුණු 4)

ii කොහොඹා කංකාරිය

අස්නේ නැටීම, කොහොඹා හැල්ල සහ මඩුපුරය.අස්නේ නැටීම, අස්නේ ගායනය සහිත සාමූහික නර්තන අංගයකි. කුවේනි අස්නෙහි එන ගායනා මෙහිදී භාවිත කරනු ලබයි. ගායනය සහිත ප්‍රථම නර්තන අංගයයි. මූලික පද 7 හා අලංකාර පද 5 විවිධ නාදමාලා හා තාලරූප වලට අනුව නර්තනයේ යොදා ගැනෙයි. එකිනෙකා පසුපස වෘත්තාකාරව නටන මෙහිදී ඇතැම් ගුරු කුලයන්හි අත්තෝරකරු විසින් මහ පන්දමක් මුලින් රැගෙන යනු ලබයි. සෑම යක් දෙස්සෙකු අතම පොල් පන්දම සහ ඊගසක් ඇත. (නම් කිරීමට ලකුණු 2, විස්තර කිරීමට ලකුණු 2)

(මේ ආකාරයට දෙවොල් මඩුවේ හෝ පහන් මඩුවේ විස්තර විය යුතුය.)

iii කොහොඹා කංකාරියේ පුරාවෘත්ත කතාවට අනුව පොරොන්දු කඩකිරීම සමාජයේ යහපැවැත්මට බාධාවක් මෙන් ම විනාශයක් ද වන බව පෙන්වා දෙයි. රාජ්‍ය ලබාගැනීමට උදවු වුවහොත් කුවේණිය සරණ පාවා ගන්නා බව පවසන විජය රජු දරු දෙදෙනකු ද සමඟ කුවේණිය පළවා හැර සමකුල කාන්තාවක් හා විවාහ වේ. මින් පෙනී යන්නේ කුල ක්‍රමය සාර්ථක විවහ ජීවිතයකට බලපාන බවයි. එමෙන් ම දුටු පමණින් පෙම් කරන්නට ගොස් කුවේණිය තම විනාශය ළඟා කර ගන්නා ආකාරය තුලින් වත්මන් තරුණ කාන්තාවන්ට මහගු ආකල්පයක් එක් කරයි. කොහොඹ කංකාරි පුරාවෘතයට අනුව අඹුසැමි විශ්වාසය, අඹුසැමි ප්‍රේමය, දරු සෙනෙහස සමාජයක යහපැවැත්මට හේතුවන බව පෙන්වා දෙයි.

පහන් මඩුව හා දොවොල් මඩුව පුරාවෘත්තයට අනුව සේරමාන් රජු අතින් මියැදෙන ගෝනදෙන වෛරයෙන් මිය යයි. වෛරය, පලිගැනීම, ක්‍රෝධය නැවත නැවතත් විපාක ගෙන දෙන බව මින් පැහැදිලි කරයි. රාජ්‍ය පාලකයින් තම අණ ක්‍රියාත්මක කිරීමේදී බුද්ධිමත් ව සිතා බැලිය යුතු බවත්, එහි වන්දිය රජකෙනෙකු වුව ද ගෙවීමට සිදුවන බව මින් පැහැදිලි කරයි. (ලකුණු 4)

(5) i සතර අභිනය

අභිනය යන වචනය සංස්කෘත වචනයකි. මෙහි අර්ථය වන්නේ ඉදිරියට ගෙනයාම යන්නයි. වෙනත් අයුරකින් පැවසුවහොත් යම් අදහසක් ඉදිරිපත් කිරීමයි. අභිනය සිවු වැදෑරුම් වේ.

**ආංගික අභිනය**

ශරීරයේ විවිධ අංගයන් ප්‍රකාශනය සඳහා යොදා ගැනීම නැතහොත් අංග චලනය මගින් අදහස් ප්‍රකාශ කිරීම ආංගික අභිනයකි. ආංගික අභිනයේදී අංග ප්‍රත්‍යංග උපාංග යන කොටස් සියල්ල භාවිතයට ගැනේ.

**වාචික අභිනය**

ගද්‍ය වශයෙන් හෝ පද්‍ය වශයෙන් වචන මාධ්‍ය කොටගෙන අදහස් ප්‍රකාශ කිරීම වාචික අභිනයයි.

**සාත්වික අභිනය**

මනෝභාවයන්ගේ හැසිරීම උපාංගයන් මගින් නිවු ලෙස ප්‍රකාශ කිරීම සාත්වික අභිනයයි. කෙටියෙන් පවසන් භාව ප්‍රකාශන මගින් අදහස් ප්‍රකාශ කිරීම හෙවත් මුහුණෙන් අදහස් ප්‍රකාශ කිරීම සාත්වික අභිනයයි.

**ආහාර්ය අභිනය**

රංග වස්ත්‍රාභරණ, රංග උපකරණ, අංග රචනය, වේදිකා සැරසිලි, වේදිකා ආලෝකය වැනි අදහස් ප්‍රකාශනය සඳහා ශරීරාංග වලට පිටතින් එක්කර ගන්නා දේ ආහාර්ය අභිනය නම් වේ.

ii හටන් කවි

පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි පාලන සමයන් තුළ සිංහල රජවරුන් සහ විදේශීය හමුදා අතර බිහිසුණු සටන් සිදු වූ අතර මෙම හටන් වලදී නායකත්වය ගෙන ක්‍රියා කළ සිංහල රජවරුන් පමණක් නොව අන්‍ය විදේශීය ජාතික සෙන්පතිවරුන්ගේ දක්ෂතාවයන්, රණකාමී බව වර්ණනා කරමින් හටන් කවි නම් කාව්‍ය ග්‍රන්ථ රාශියක් ලියැවී ඇත. මේවා නම්,

මහ හටන, පරංගි හටන, කොන්ස්තන්තීනු හටන, ඉංග්‍රීසි හටන, දුනුවිල හටන ආදීයයි.

හටන් කවි ගායනා මගින් රණශූරයන්ගේ වීරත්වය, අභීතබව, රණකාමීත්වය වැනි ලක්ෂණ පෙන්නුම් කරයි.

උදා: - ''යනෙන කළුගඟ එතෙර වැඩසිට
රජුන් යන මං බලව බලවා
දිලෙන රත් ගඟ අතට අරගෙන
විදුලියන් මෙන් ලෙලව ලෙලවා''

පරංගි හටන

''යුද්දෙටත් ඇවිත් සිදු පිට නැවී නැගිලා පංරගි''

Answer

iii අංග රචනය

අංග රචනය යනු කිසියම් නර්තන ශිල්පියකු හෝ ශිල්පිනියකගේ කිසියම් නළුවකු හෝ නිළියකගේ රංග වස්ත්‍රාභරණයන්ගෙන් ආවරණය නොවූ කොටස් චරිතයේ ස්වභාවයටත් රංගාලෝකයටත් උචිත වන පරිදි සකස් කර ගැනීමයි. චරිතයේ ස්වරූපය වඩාත් තීව්‍ර කර දැක්වීමට, වේදිකා ආලෝකණය යටතේ ශරීරයේ නිරාවරණ පෙදෙස් වඩාත් පැහැපත් ව තබා ගැනීමටත් අංග රචනය වැදගත් වේ. අංග රචනය සරල අංග රචනය හා චරිතාංග අංග රචනය යනුවෙන් කොටස් දෙකකට බෙදේ.

iv ද්‍රවිඩ ගැමි නැටුම්

ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර ප්‍රදේශ වල හා උඩරට වතුකරයේ ජීවත්වන ද්‍රවිඩ ජනතාව අතර ඔවුන්ට ආවේණික වූ ගැමි නැටුම් සම්ප්‍රදායයක් පවතින අතර මේවා ද්‍රවිඩ ගැමි නැටුම් නමින් හඳුන්වයි. මේවා ඉන්දීය ද්‍රවිඩ සංස්කෘතියෙන් උරුම වූ ඒවා ලෙස සැලකිය හැකි ය. ද්‍රවිඩ ගැමි නැටුම් තුල ද දේශීය සිංහල ගැමි නැටුම්වල මෙන් ම ඔවුන්ගේ ජීවන වෘත්තීන්, කෙළි සෙල්ලම්, ආගමික විශ්වාස හා බැඳී පවතී. ආගමික පදනමක් මත බිහිවී ඇති කරගම්, කවාඩි නර්තනාංග හා විනෝදය පදනම් කොටගෙන බිහිවී ඇති කුම්මි, කෝලාට්ටම් චෙම්බු වැනි ගැමි නර්තනාංගත් මේ යටතේ පෙන්වා දිය හැකි ය.

**කරගම්** - විවිධ වර්ණවත් මල් වැල් වලින් සරසන ලද පිත්තල බඳුන් හිසමත සමබර කර ගනිමින් එම මල්වැල් අලංකාර ලෙස විසිර යන සේ වට කැරකෙමින් කරනු ලබන මෙම නර්තනය වර්ෂාව සම්බන්ධයෙන් කරනු ලබන දේව පූජාවක් ලෙස බිහි වී ඇත.

**කවාඩි** - මුරුගන් දෙවියන්ට කරනු ලබන පූජා නර්තනයක් ලෙස සැලකෙන කවාඩි නර්තනය මුරුගන් දෙවියන්ට පූජා භාණ්ඩ රැගෙන ගිය කඳ සිහිපත් කරමින් නිර්මාණය වූ බව පැවසේ. කවාඩි වර්ග කිහිපයකි.

පාල් කවාඩි, පැන්තිර් කවාඩි, පුෂ්ප කවාඩි,එකරේ,කවාඩි, තුකු කවාඩි

**කෝලාට්ටම්** - සිංහල ලී කෙළි නැටුමට සමාන කමක් දක්වන මෙය ලී දෙකක් අත දරා තාලයට ගසමින් නර්තනය කරයි.

**සෙම්බු** - සිංහල කළගෙඩි නැටුමට සමානාන්තරව දරයි. එදිනෙදා ජීවිතයේ කරනු ලබන දිය ගෙන ඒම පැළ වලට දැමීම වැනි ක්‍රියාවක් අලලා නිර්මාණය වී ඇත.

**වන්නම්** - උඩරට, පහතරට, සබරගමු යන සම්ප්‍රදායන් තුනෙහි ම වන්නම් දැකිය හැකි ය. මුලින් ම ගායනය සඳහා රචනා වූවා යැයි සැලකෙන වන්නම් යම්කිසි දෙව් පුද්ගලයෙක්, රජකෙනෙක්, සතෙකු, වස්තුවක් යම්කිසි සිදුවීමක් වර්ණනා කිරීම උදෙසා රචනා වී ඇත.

උඩරට වන්නම් මහනුවර යුගයේදී ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජ දවස කවිකාර මඩුවේදී රම්මාලාවක අධිකාරම, ගණිතාලංකාර, මල්වතු විහාරාධිපති හිමි නමකගේ සහභාගීත්වයෙන් රචනා වූ බව කියවේ. උඩරට වන්නම් 18 ඇති අතර බෙරපදය, තානම කවිය, කස්තිරම, සීරුමාරුව අඩව්ව යන කොටස් හයක් උඩරට වන්නමක සමන්විත වේ.

පහතරට වන්නම් සිංදු වන්නම් නමින් හඳුන්වන අතර ඒවා විෂ්ණු දෙවියන් වර්ණනා කරමින් රචනා වී ඇත. දඹදෙණි කෝට්ටේ යුග අතර කාලයේදී බරණ ගණිතයා විසින් රචනා කරන ලදැ යි සැලකෙන සිංදු වන්නම් 32 වීරිත් 32 හා පදනම් කොට ගෙන රචනා වී ඇත. සිංදු වන්නමක කොටස් ලෙස බෙර පදය. තානම. කවිය ඉරට්ටිය සඳහන් කළ හැකි ය.

සමන්දේවාලය ආශ්‍රිතව දඹදෙණි යුගයත් කෝට්ටේ යුගයත් අතර රචනා කරන්නට ඇතැ යි සැලකෙන සබරගමු වන්නම් 24 කි. එහි කොටස් ලෙස දවුල් පදය, තානම කවිය, කලාසම අඩව්ව හැඳින්විය හැකි ය. (ලකුණු 12)

(7) i අධ්‍යාපනික වශයෙන් ඇති වූ නව ප්‍රවනතා

සමාජ අවශ්‍යතා හා ආකල්ප මත ඇති වූ නව ප්‍රවනතා

නව තාක්ෂණික ක්‍රම මත පදනම් ව ඇති වූ නව ප්‍රවනතා

විවිධ සංස්කෘතීන්ගෙන් බලපෑම මත ඇති වූ නව ප්‍රවනතා (ලකුණු 4)

ii රාජ්‍ය උත්සව සඳහා

මංගල උත්සව සඳහා

සංදර්ශන හා ප්‍රසංග සඳහා

වර්තමානයේ නර්තන කලාව සමාජ අවශ්‍යතා සඳහා යොදා ගැනීමේදී වානිජත්වය නැඹුරු වීම ප්‍රබල ලෙස දැකිය හැකි ය. අධ්‍යයතනයේ විවිධ නර්තන කණ්ඩායම් ගොඩනගා ගනිමින් ස්වාධීනව ආදායම් ලැබීමට පුරුදු ව සිටින අතර විවිධ රාජ්‍ය උත්සව පිළිගැනීමේ උත්සව ආදියට ද අද නර්තනය නැතිවම බැරි දෙයකි. මංගල උත්සව වලදී මනාල යුවල නැටුමට ගැයුමට මෙන් ම මංගල උත්සවයට සහභාගි වූ අය සතුටු කිරීමට ද අද විවිධ නර්තනාංග යොදා ගන්නා අතර, විවිධ උත්සව අවස්ථාවලදීත්, සංගීත සංදර්ශන වලදීත් විනෝදාස්වාදය උදෙසා නර්තනය යොදා ගනු ලබයි. (නම් කිරීමට ලකුණු - 2, විස්තර කිරීමට ලකුණු - 2)

iii මිල මුදල් මත හඹා යන වත්මන් සමාජ සංස්ථාව තුළ අධ්‍යන නර්තන කලාව මූල්‍ය උත්පාදන මාර්ගයක් සේ යොදා ගෙන ඇත. විවිධ නර්තන කණ්ඩායම් ගොඩ නගා ගනිමින් කාන්තා දායකත්වය ප්‍රබල ලෙස ප්‍රාසාංගික වේදිකාව වෙත නැඹුරු කරගනිමින් අතීතයේ ප්‍රජාර්ථය සඳහා යොදා ගත් නර්තනය වර්තමානයේදී විනෝදය පෙරදැරිව සමාජ අවශ්‍යතාවයන් මත ඉදිරිපත් කරන අතර එය බොහෝ දෙනෙකුගේ මූල්‍ය උත්පාදන මාර්ගයක් ලෙස යොදාගෙන ඇත.

විවිධ උත්සව, මංගල උත්සව ආදියේ නර්තන ඉදිරිපත් කිරීමට පැකේජ් ලෙසින් නර්තන කණ්ඩායම් අද ලබා ගත හැකි ය. විශේෂයෙන් ම සංගීත සංදර්ශන වල ගීත ගායනයට වඩා නර්තනයට ප්‍රමුඛත්වය හිමිවන අතර ඒ සඳහා මුදලට ඉදිරිපත් වන නර්තන කණ්ඩායම් බිහි වී සිටියි. (ලකුණු 4)